# සරත්, ජ වි පෙ හා ජාතිකත්වය

ජාතිකත්වය වෙනුවෙන් පෙනී සිටි ඒ වෙනුවෙන් සටන් කළ සරත් ෆොන්සේකා පමණක් නොව යළිට මහට ලෙස ජාතිකත්වයේ ධජය අතට ගත් ජ වි පෙරමුණ ද අද දක්නට නැත. ඒ වෙනුවට අද ඇත්තේ විජාතික බලවේගවල නියෝජිතයකු වූ සරත් ෆොන්සේකා කෙනකු සහ එලෙස ම විජාතික බලවේගවල තවත් පක්ෂයක් වූ ජ වි පෙරමුණ ය. ජනවාරි මස 26 වැනි දිනට යෙදී ඇති ජනාධිපතිවරණය මෙරට ජාතිකත්වයේ ඉතිහාසයේ සන්ධිස්ථානයක් වන අතර එයින් මහින්ද රාජපක්ෂ මහතා ජයග්‍රහණය කිරීම ඉර හඳ මෙන් සහතික වුව ද ජනාධිපතිවරණයෙන් බලවේගයක් ලෙස ජාතික බලවේගයට යම් පසුබෑමක් සිදුවනු ඇත. අප ඒ බව සඳහන් කරන්නේ මන්දෝත්සාහි වීමට නොව ජාතිකත්වයේ මීළඟ අදියරට පිවිසීමට පසුබිම සකස්කර ගැනීමට ය.

සරත් ෆොන්සේකා රනිල් වික්‍රමසිංහ තරම්වත් ඡන්ද ලබාගනු ඇතැයි විශ්වාස කළ නො හැකි ය. ඔහුගේ ජනාධිපතිවරණ ව්‍යාපාරයේ උච්ඡතම අවස්ථාව වූයේ ඔහු දැනට සති දෙකකට පෙර පැවැත්වූ පුවත්පත් සාකච්ඡාවයි. ඒ සාකච්ඡාවෙන් පසු ජනාධිපතිවරණය තෙක් ඇත්තේ අවගමනය හා අවමානය පමණකි. දැන් ජ වි පෙ තවත් සරත් කෙනකු ගැන කතාකරයි. ඒ අගමැති ධුරය සඳහා ය. ඒ සරත් හා මේ සරත් හැරෙන්නට තවත් සරත්ලා ඇත්දැයි අපි නො දනිමු. එහෙත් ජ වි පෙ නායකයන්ට දැන් තමන් කියන්නේ කුමක් ද යන්න ගැනවත් අවබෝධයක් නැති බව පැහැදිලි ය.

විටෙක ඔවුන් කියන්නේ මීළඟ ආණ්ඩුව භාරකාර ආණ්ඩුවක් පමණක් බවත් එහි අගමැතිවරයකු නැති බවත් ය. එ ජා පක්ෂයට නම් අවශ්‍ය වන්නේ විධායක අගමැතිවරයෙකි. එහෙත් ඒ අගමැති භාරකාර ආණ්ඩුවේ අගමැති කෙනකු විය නොහැක්කේ එවැන්නකු පත්කරගැනීමට ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය බැවින් ය. ඒ කෙසේ වෙතත් අගමැතිවරයකු නැති ආණ්ඩුවක තවත් සරත් කෙනකු අගමැති කරන්නේ කෙසේ ද යන්න ජ වි පෙරමුණේ නායකයන් පමණක් දන්නා කරුණක් විය යුතු ය.

ඒ අතර රනියා පොදු අපේක්ෂකයා හෙවත් එ ජා පෙරමුණේ අපේක්ෂකයා කියා ඇත්තේ තමා හුදෙක් උත්සවවලට පමණක් සීමා වූ ජනාධිපතිවරයකු නොවන බව ය. කවුරුන් කුමන බලාපොරොත්තු ඇතිව සිටිය ද සරත් ෆොන්සේකා බැරිවෙලාවත් ජනාධිපති වුවහොත් (ඒ සඳහා ඔහුට කිසිම ඉඩක් නැත. එහෙත් තර්කය සඳහා ඒ එසේ යැයි අපි උපකල්පනය කරම. එසේ ම ඔහු ජනාධිපතිවීමෙන් හා රනිල් අගමැති කිරීමෙන් පසුව මියගියහොත් රනිල්ට ජනාධිපති වීමේ අවස්ථාවක් ලැබෙන බවත් අමතක නොකරමු.) ඔහු විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට එකඟ නොවනු ඇත. එ ජා පක්ෂයටවත් ජ වි පෙරමුණටවත් එවැනි බලාපොරොත්තු ඇතැයි සිතිය නො හැකි ය. අප කලින් ද කියා ඇති පරිදි විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම යනු තමන් පරදින බව දන්නා මේ පක්ෂ දෙකම ජනාධිපතිවරණයෙන් ඉවත්වීම සඳහා යොදාගන්නා උප්පරවැට්ටියක් පමණකි. ඒ ව්‍යාජ පොරොන්දුවක් බව කිසිවකුටත් වඩා හොඳින් දන්නේ මේ පොරොන්දුව මත කිහිපවතාවක් ම ජනාධිපතිවරණවලින් ඉවත් වී ඇති ජ වි පෙරමුණ ය. බලාපොරොත්තු ඇතිකර ගන්නේ දේශපාලන මගඩි ගැන අවබෝධයක් නැති අහිංසක ජනතාව ය.

සරත් ෆොන්සේකා ජනාධිපතිවරණයට ඉදිරිපත් විය හැකිය යන්න සාකච්ඡා වීමට පටන්ගැනීමෙන් පසු එහි ඇති භයානකත්වය අපි කියා සිටියෙමු. එයට ප්‍රධාන හේතුව වූයේ ජාතිකත්වයට ඉන් පහර වැදීම ය. ජාතිකත්වයේ ඡන්ද බෙදී යෑමක් ගැන මෙහි දී නො කියැවෙයි. ජාතිකත්වයේ ඡන්දවලින් නොගිණිය හැකි ප්‍රමාණයක ඡන්ද සරත් ෆොන්සේකාට ලැබෙනු ඇත. ඔහුට ලැබෙන්නේ සාම්ප්‍රදායිකව එ ජා පක්ෂයට දෙන ඡන්දවලින් සැලකිය යුතු ප්‍රමාණයක් හා ජ වි පෙ සාමාජික සාමාජිකාවන්ගෙ ඡන්දවලින් යම් ප්‍රමාණයක් ය. ජ වි පෙ හිතවත්තු විශාල ප්‍රමාණයක් මෙවර ජ වි පෙරමුණ, එ ජා පක්ෂය ප්‍රමුඛ එ ජා පෙරමුණේ අපේක්ෂකයාට ආධාර කිරීම ගැන කළකිරී සිටිති. ඔවුන්ගේ ඡන්ද සරත් ෆොන්සේකාට නො ලැබෙනු ඇත. අනෙක් අතට මනෝ ගනේෂන් හා රවුෆ් හකීම් කුමක් කීව ද දෙමළ හා මුස්ලිම් ජනයාගෙන් අති විශාල බහුතරය සරත් ෆොන්සේකාට ඡන්දය නො දෙනු ඇත.

ඒ සියල්ලෙහි හා තවත් කරුණුවල ප්‍රතිඵලයක් ලෙස සරත් ෆොන්සේකා තරග කිරීම හේතුවෙන් ජාතික බලවේගයේ ඡන්දවල අඩුවක් සිදු නොවනු ඇත. ජාතික බලවේගයට ඉන් හානිය වන්නේ රනියා තොරතුරු ඔස්සේ ය.

© Prof. Nalin De Silva

ජනාධිපතිවරණයේ දී නොයෙකුත් චෝදනා හා ප්‍රතිචෝදනා ඉදිරිපත් කෙරෙනු ඇත. සරත් ෆොන්සේකාට විරුද්ධව කෙරෙන ප්‍රචාර හා චෝදනා වැඩි වශයෙන් ම එල්ල වනු ඇත්තේ ජාතික ව්‍යාපාරයට ය එහි දී ඒ ජා පක්ෂය ඔස්සේ ජාතිකත්වයට එල්ල වන ප්‍රධාන ප්‍රහාරයක් නැත. ඔවුන්ට විරුද්ධව ඇත්තේ සටන් මෙහෙයුම්වලට ඔවුන් එරෙහි වීම ය. එහෙත් ඒ චෝදනාව ඒ ජා ප විජාතික බලවේගයේ කොටසක් වීම නිසා එල්ලවන්නකි.

ජනාධිපතිවරණයේ දී එකිනෙකාට එල්ල වන චෝදනා සහ ඊනියා තොරතුරු සත්‍ය යැයි පිළිගැනීමට අප සූදානම් නැත. ඊනියා තොරතුරු ඔස්සේ මැතිවරණයක දී සිදුවන්නේ සත්‍යයක් හෙළිදරව් වීම නොව ජනතාවගේ සිත් සතන්වල සැකයක් ඇති කිරීම ය. විජාතික බලවේග ඒ සත්‍ය ලෙස ගනිමින් ජාතික බලවේගයට චෝදනා එල්ල කරනු ඇත. අප මෙයින් අදහස් කරන්නේ ජාතික බලවේගවල කිසිම වරදක් නැති බව නො වේ. ජාතික බලවේගවල ද දුර්වල කම් ඇත. (තමන්ට දුර්වලකම් නැතැයි සිතන්නෝ අංක එකේ කුහකයෝ වෙති.) එහෙත් ජනාධිපතිවරණයේ දී මේ දුර්වලකම්වලට අසත්‍ය චෝදනා තොග ගණනින් එකතු වී ජාතික බලවේගවලට පහර පිට පහර වදිනු ඇත. එහි දී අප කලින් කියා ඇති පරිදි දෙමළ ජාතිවාදීන් හා අනෙක් විජාතික බලවේග දෙපැත්තට එකතු වී උල්පන්දම් දෙමින් ජාතිකත්වයට පහර දෙනු ඇත.

විජාතික බලවේග සරත් ෆොන්සේකා ජනාධිපතිවරණයට ඉදිරිපත් කර ඇත්තේ හොඳින් කල්පනා කර ය. විජාතික බලවේග මුල දී සරත් ෆොන්සේකා සමග සම්බන්ධකම් ගොඩනගන්නට ඇත්තේ මංගල සමරවීර හා ජ වි පෙ ඔස්සේ යැයි සිතිය හැකි ය. ඒ කුමක් වුවත් විජාතික බලවේගවලට අවශ්‍ය වන්නේ ජනාධිපතිවරණයෙන් සරත් ෆොන්සේකා දිනවීම නොව ඊනියා තොරතුරු එකතු කිරීම ය. ඒ තොරතුරු (ඒවා අසත්‍යද නැද්ද යන්න විජාතික බලවේගවලට ප්‍රශ්නයක් නො වේ.) දඩමීමා කරගෙන ඊනියා යුද්ධ අපරාධ සම්බන්ධයෙන් හැකි නම් නඩු පැවරීම බටහිරයන්ගේ විශේෂයෙන් ම බ්‍රිතාන්‍යයන්ගේ අරමුණ වෙයි. ඒ අරමුණ සාක්ෂාත් කරගැනීමෙහි ලා ඔවුන් නොකරන දෙයක් නැත.

2011 මෙරට පැවැත්වීමට නියමිත ව තිබූ පොදු රාජ්‍ය මණ්ඩල නායකයන්ගේ සම්මේලනය අප රටට අහිමි වූයේ බ්‍රිතාන්‍ය හේතු කොටගෙන ය. සටන් මෙහෙයුම්වල දී ලංකාණ්ඩුවේ හමුදා නොයෙකුත් ආකාරයට මානව හිමිකම් කඩ කර ඇතැයි බ්‍රිතාන්‍ය කියයි. බ්‍රිතාන්‍ය එසේ කීව ද, ඔවුන්ට ඒ බව සාක්ෂි මත පදනම් වී සනාථ කළ නො හැකි ය. අනෙක් අතට බ්‍රිතාන්‍ය කඩකර ඇති ඔවුන්ගේ ම සංස්කෘතියේ අර්ථ දැක්වෙන මානව අයිතිවාසිකම් අනුව පළමුවෙන් ම පොදු රාජ්‍ය මණ්ඩලයෙන් බ්‍රිතාන්‍ය එළවිය යුතු ය. ඒ කෙසේ වෙතත් බ්‍රිතාන්‍ය ප්‍රමුඛ බටහිර රටවල් තම නියෝජිතයා වූ කොටි පැරදවීම හා එහි දී බටහිරයන්ගේ බලපෑම්වලට යටත් නොවීම සම්බන්ධයෙන් මහින්ද රාජපක්ෂ මහතාට කිසි දිනෙක සමාවක් නොදෙනු ඇත.

බටහිරයන්ට අවශ්‍ය කරන්නේ කොටි පැරදවීමේ කීර්තිය අවතක්සේරු කිරීම ය. ඊනියා යුද්ධ අපරාධ චෝදනා ඒ වෙනුවෙනි. ඒ චෝදනා සනාථ නොවුණත් ජනාධිපතිවරණයේ හෙළිවන ඊනියා තොරතුරු තම අරමුණ ඉටුකරගැනීම සඳහා යොදාගැනීමට බටහිරයන් ක්‍රියාකරනු ඇත. ඔවුන්ට සරත් ෆොන්සේකා අවශ්‍ය වන්නේ මේ ඊනියා තොරතුරු නිර්මාණය කරගැනීම සඳහා පමණ ය. තම අවශ්‍යතාව ඉටුකරුනීමෙන් පසුව සරත් ෆොන්සේකා ඉවත්කිරීම වුව ද ඔවුන්ට ප්‍රශ්නයක් නො වේ.

සරත් ෆොන්සේකාගේ ජනාධිපතිවරණ ව්‍යාපාරයට විජාතික බලවේග එතරම් මුදලක් වියදම් නොකරනු ඇත්තේ ඔවුන් ඔහුගෙන් ජයග්‍රහණයක් බලාපොරොත්තු නොවන බැවිනි. ඔහුගේ ඡන්ද ව්‍යාපාරය ජ වි පෙරමුණේ කරමත පැටැවනු ඇත. ජ වි පෙ තම ජාතිකත්වයේ සළු පිළි ඉවත ලා ඒ ජා පෙරමුණේ අපේක්ෂකයා වූ සරත් ෆොන්සේකාට ආධාර කරනු ඇත. සරත් ෆොන්සේකා නිර්පාක්ෂික යැයි ජ වි පෙරමුණේ ඇතැමුන් කියන්නේ නිර්ලජ්ජිතව ය. ජාතික බලවේගවල හා විජාතික බලවේගවල නියෝජිතයන් අතර සටනේ දී ජ වි පෙ තම පැත්ත කුමක්දැයි පැහැදිලිව ම දක්වා ඇත. ජනාධිපතිවරණයෙන් ජාතික බලවේගවලට යම් පසුබෑමක් අයත්වන්නේ එහි සංඛ්‍යාත්මක ප්‍රතිඵලය මත නොව එහි දී නිර්මාණය කෙරෙන ඊනියා තොරතුරු මත ය. ඒ ඊනියා තොරතුරුවල බලපෑම පරාජය කිරීමට ජාතික බලවේග සැලසුම් සහගත ව ක්‍රියාත්මක විය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva